සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

| 10 ශ්‍රේණිය | **නර්තනය - I** | කාලය පැය 01 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. සරඹ අභ්‍යාස කිරීමේදී දෙගුණ ලෙස හඳුන්වන්නේ .................................................................. ලයට නැටීම ය.
    (1) ද්‍රැත (2) විලම්භ (3) මධ්‍ය (4) ප්ලුත

02. "සොබමත් දෙවිවරු සදෙනෙක් එතැනට" මෙම කවි පද කොටස .................................... නැටුමට අයත් වේ.
    (1) ඔංචිලි වාරම් (2) චාමර (3) ගොයම් (4) රබන්

03. බිම සකස් කිරීම, පැල සිටුවීම, අස්වනු නෙලීම, අස්වනු ගබඩා කිරීම යන ක්‍රියාකාරකම් දක්වෙන්නේ, ......................................................... .
    (1) කෘෂි කර්මාන්තයේදී ය. (2) පතල් කර්මාන්තයේදී ය.
    (3) ධීවර කර්මාන්තයේදී ය. (4) මැටි කර්මාන්තයේදී ය.

04. බෙර වාදනයේදී තත්, ජිත්, තොං, නං නමින් හඳුන්වන ස්වරාක්ෂර, ..................................... නමින් ද හඳුන්වයි.
    (1) ගර්භාක්ෂර (2) සංයුතාක්ෂර (3) උපකාරාක්ෂර (4) බීජාක්ෂර

05. "තත්කඩ කඩතක ජිජිකුඳ..." මෙම කස්තිරම අයත් ගොඩ සරඹය ............................................................... යි.
    (1) බඹර සරඹය (2) චන්ද්‍රිකා සරඹය (3) අංගහාර සරඹය (4) පැනීම් සරඹය

06. මහා පරාක්‍රමබාහු රජතුමා සෙබලුන්ගේ ආස්වාදය පිණිස නැටුම්, ගැයුම්, වැයුම් කරවූ බව ............................. ....................................................... සඳහන් වේ.
    (1) මහා වංශයේ (2) චූල වංශයේ (3) බෝධි වංශයේ (4) ථූප වංශයේ

07. "අට දෙන අට කොන වාඩි වෙයල්ලා ....." මෙය ........................................................................... කවියකි.
    (1) චාමර (2) සිරස පාද (3) ඔන්චිලි වාරම් (4) මල් යහන්

08. ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායට අයත් ....................................................... , ශාන්තිකර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයකි.
    (1) තාලම් (2) සවුදම් (3) වන්නම් (4) වන්දමානම්

09. උඩරට නර්තන කලාවේ ප්‍රවීණ ශිල්පියෙකු ලෙස ................................................................. හැඳින්විය හැකි ය.
    (1) අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා (2) එච්. එස්. සව්රිස් සිල්වා
    (3) විල්සන් ඔලබොඩුව මහතා (4) සිරිබෝහාමි මහතා

10. "වමත සුරත නළලේ අළු ගාගෙන - දැත් දෙබැම තේ සෝරුද ගාගෙන"
    මෙම කවියෙන් විස්තර කෙරෙන්නේ ................................................................................. චරිතයයි.
    (1) වෙදරාළගේ (2) ගුරුහාමිගේ (3) සොත්තානාගේ (4) පරයාගේ

11. ලාස්‍ය හා තාණ්ඩව ලක්ෂණ පිළිබිඹු කරන ගැමි නැටුම් දෙකකි.

(1) කළ හා ලී කෙළි (2) කළ හා ගොයම්

(3) චාමර හා රබන් (4) ලී කෙළි හා චාමර

12. "තකුතක ......................... කුංදත් ගජ්ජිත් ........................... කුංදත් තකුතක තරිකිට කුංදත් තා" යන සීරුමාරුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් ඇතුළත් වරණය.

(1) ජික්කඩ, තකජිත් (2) කුඳගත, ජික්කුං

(3) කුංදත්, තරිකිට (4) තරිකිට, තකජිත්

13. මළබෙර හා රණබෙර වාදන තුළින් ජනිත වන රසයන් වන්නේ,

(1) කරුණ , වීර (2) කරුණ , ශෘංගාර

(3) භයානක , වීර (4) කරුණ , භයානක

14. "කැලණි පාලම" සහ "දෙපානෝ" යන නාට්‍යයන් අයත් ශෛලීන් වනුයේ,

(1) ශෛලිගත හා ගීත ය. (2) මුද්‍රා හා ශෛලිගත ය.

(3) ගීත හා මුද්‍රා ය. (4) තාත්වික හා ගීත ය.

15. දළදා වහන්සේ මාළිගයෙන් පිටතට වැඩමවීමේදී හා මාළිගය තුළට වැඩමවීමේදී වාදනය කරනු ලබන හේවිසි වාදනයන් වන්නේ,

(1) ගෙමැදුම් හේවිසි හා අඹරා හේවිසි ය. (2) අඹරා හේවිසි හා ගෙවැදුම් හේවිසි ය.

(3) පෝය හේවිසි හා තේවා හේවිසි ය. (4) තේවා හේවිසි හා පෝය හේවිසි ය.

- පහත රූප සටහන් ඇසුරින් 16 - 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය



B රූපය



C රූපය



D රූපය

16. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ නර්තන ශිල්පියෙකු අයත් රූපය වන්නේ,

(1) A රූපය යි. (2) B රූපය යි.

(3) C රූපය යි. (4) D රූපය යි.

17. මණ්නඩිරාළ හා මකුළුවා යන ද්විත්ත්ව චරිත නිරූපණය කළ ශිල්පියා දක්වෙන්නේ,

(1) A රූපයේ ය. (2) B රූපයේ ය.

(3) C රූපයේ ය. (4) D රූපයේ ය.

18. ගොයම් කැපීමේ නැටුම වේදිකාවට උචිත ලෙස නිර්මාණය කළ ශිල්පියා හෝ ශිල්පිණිය දක්වෙන්නේ,

(1) A රූපයේ ය. (2) B රූපයේ ය. (3) C රූපයේ ය. (4) D රූපයේ ය.

19. සැස්සේරුව හා පාලමොට්ටායි යන සෙල්ලිපි දෙක අයත් යුග පිළිවෙලින්,

(1) අනුරාධපුරය හා දඹදෙනිය යි. (2) අනුරාධපුරය හා මහනුවර යි.

(3) අනුරාධපුරය හා පොළොන්නරුව යි. (4) පොළොන්නරුව හා අනුරාධනුරය යි.

20. මුහුණට දහඩිය දැමීමෙන් ඇතිවන දිලිසෙනසුළු ස්වභාවය අවම කර ගැනීම සඳහා භාවිත ද්‍රව්‍යයකි.

(1) පැන් කේක් (2) පවුඩර් පෆ්

(3) රිමූවින් ක්‍රීම් (4) ලයිනින් කලර්ස්

● 21 - 25 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1. | සොකරි | බෙරහඬ | අංජලිකා චිත්‍රසේන මහත්මිය |
| 2. | කරදිය | නලදමයන්ති | සෝමබන්දු විද්‍යාපති මහතා |
| 3. | කුඹී කතාව | සිංහබාහු | බන්දුල ජයවර්ධන මහතා |

21. ශෛලිගත නාට්‍යයක් සඳහන් වන්නේ,
(1) 2 පේළියේ B තීරුවේ ය. (2) 3 පේළියේ A තීරුවේ ය.
(3) 1 පේළියේ A තීරුවේ ය. (4) 3 පේළියේ B තීරුවේ ය.

22. "තුන්මස් තුන් පෝයක් ගත වන්නේ" කවිය අයත් නාට්‍ය සඳහන් වරණය වන්නේ,
(1) 1 පේළියේ A තීරුව (2) 2 පේළියේ A තීරුව
(3) 3 පේළියේ A තීරුව (4) 3 පේළියේ C තීරුව

23. "හතික වරෙව් කොල්ලනේ" යන ගීතය ඇතුළත් නාට්‍යය හා එම නාට්‍යය නිෂ්පාදනය කළ ශිල්පියා ඇතුළත් වන්නේ,
(1) 1 පේළියේ A හා 1 පේළියේ C තීරුවල ය. (2) 2 පේළියේ B හා 3 පේළියේ C තීරුවල ය.
(3) 3 පේළියේ A හා 1 පේළියේ C තීරුවල ය. (4) 1 පේළියේ B හා 3 පේළියේ C තීරුවල ය.

24. 2007 වර්ෂයේ රචිත මුද්‍රා නාට්‍යය හා එම නාට්‍යය නිර්මාණය කළ ශිල්පිණිය ඇතුළත් වන්නේ,
(1) 1 පේළියේ A හා 2 පේළියේ C තීරුවල ය. (2) 3 පේළියේ A හා 1 පේළියේ C තීරුවල ය.
(3) 1 පේළියේ C හා 2 පේළියේ C තීරුවල ය. (4) 3 පේළියේ A හා 3 පේළියේ C තීරුවල ය.

25. කරදිය මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ සහ පසුබිම් අලංකරණ ශිල්පියා දක්නට ලැබෙන්නේ,
(1) 1 පේළියේ C තීරුවේ ය. (2) 3 පේළියේ C තීරුවේ ය.
(3) 2 පේළියේ B තීරුවේ ය. (4) 2 පේළියේ C තීරුවේ ය.

26. උඩරට ගොඩ සරඹවල 10, 11, 12 යන ගොඩසරඹ නාමයන් පිළිවෙලින්,
(1) පැනීම්, බඹර හා චන්ද්‍රිකා හරඹ වේ. (2) බඹර, පැනීම් හා චන්ද්‍රිකා සරඹ වේ.
(3) බඹර, චන්ද්‍රිකා හා පැනීම් සරඹ වේ. (4) චන්ද්‍රිකා, බඹර හා පැනීම් සරඹ වේ.

27. මැදුම් තනි තිතට හා සුළු මහා දෙතිතට වාදනය කළ හැකි බෙර පද පිළිවෙලින්,
(1) ජිං ගත ගොගො හා දොං දොං ජිං ජිං ගජිගත
(2) දොදොංත තකු දොං හා දොං දොං ජිං ජිං ගජිගත
(3) දොං දොං ජිං ජිං ගජිගත හා ජිං ගත ගොගො
(4) ජිං ගත ගොගො හා ජිං ජිං තකට දොංතක

28. උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන් හි අන්තර්ගත, හස්ත පාද භාවිතා කරමින් ඉදිරිපත් කරන සරඹ විශේෂ වන්නේ,
(1) දොඹින පද, ඉලංගම් සරඹ හා ගොඩ සරඹ ය. (2) අත් සරඹ, දොඹින පද හා ඉලංගම් සරඹ ය.
(3) ගොඩ සරඹ, ඉලංගම් සරඹ හා දොඹින පද ය. (4) අත් සරඹ, ගොඩ සරඹ හා ඉලංගම් සරඹ ය.

29. "විදෙන ලෙලෙන නරුබර පුළුලුකුල රැඳී" යන කවිය ඇතුළත් සන්දේශ කාව්‍යය හා එය අයත් යුගය වන්නේ,
(1) සැළලිහිණි සංදේශය හා කෝට්ටේ යුගය යි. (2) තිසර සංදේශය හා ගම්පොළ යුගය යි.
(3) තිසර සංදේශය හා කෝට්ටේ යුගය යි. (4) සැළලිහිණි සංදේශය හා ගම්පොළ යුගය යි.

30. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පූජා භාණ්ඩ අතැතිව සිදුකරනු ලබන නර්තන අංගයකි.
(1) ආවැන්දුම (2) හත්පදය
(3) කොහොඹා හැල්ල (4) යක්තුන් පදය

31. කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය හා මැටි කර්මාන්තය යන ගැමි නර්තන අංග සඳහා භාවිත රංග උපකරණ පිළිවෙලින් ................

(1) යතුර, උදැල්ල සහ සකපෝරුව
(2) සකපෝරුව, මාදැල සහ යතුර
(3) සකපෝරුව, යතුර සහ උදැල්ල
(4) යතුර, මාදැල සහ සකපෝරුව

32. උඩරට ගැටබෙරයට පමණක් ආවේණික පාරිභාෂික පද වේ.

(1) හැක්ම, වෙනිවර සහ වලයම
(2) සුරත්තට්ටුව, ගැටය සහ පුහුල
(3) පුහුල, සුරත්තට්ටුව සහ කුන්දිරම්පල්ල
(4) ගිගිරි වළල්ල, සුරත්තට්ටුව සහ පුහුල

33. උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන්ට අයත් වන්නම් පිළිවෙලින් .................................... වේ.

(1) සැවුලා, විරාඩි සහ මුසලඩි
(2) සැවුලා, නාතිලිංචි තාලය සහ මණ්ඩුක
(3) සිංහරාජ, අනුරාග දණ්ඩතාලය සහ වෛරොඩි
(4) සිංහරාජ, සැවුලා සහ අනුරාගදණ්ඩ තාලය

34. භරත සහ කථක් නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ පිළිවෙළින්,

(1) මෘදංගය හා තබ්ලාව වේ.
(2) තබ්ලාව හා චෙන්ඩාව වේ.
(3) චෙන්ඩාව හා මෘදංගය වේ.
(4) නට්ටුවාංගම් හා සාරංගිය වේ.

35. අලංකාර මාත්‍රාවල දැකිය හැකි ලක්ෂණයක් **නොවන්නේ** .........

(1) ගොඩසරඹ නර්තනය කිරීම.
(2) අදාළ තාලරූපයේ ගති ලක්ෂණ ඉස්මතු කිරීම.
(3) දිසා, තල හා සම්බන්ධතා නිසිලෙස පවත්වා ගැනීම.
(4) කැරකීම්, පැනීම් සහ සුරල් වලින් උපලක්ෂිත වීම.

36. ජීවන වෘත්තීන් හා බැඳි ගැමි නැටුම් ලෙස මේවා හැඳින් වේ.

(1) කෘෂි, පතල්, මැටි සහ චාමර
(2) ධීවර, මැටි, කෘෂි හා කොහු
(3) ධීවර, පතල්, කළ හා තේ දළු
(4) කෘෂි, කොහු, ධීවර හා කළ

37. නර්තන කලාවේ උන්නතිය උදෙසා රාජ්‍ය අනුග්‍රහය දැක්වූ අනුරාධපුර යුගයට අයත් රජවරු ලෙස හැඳින්විය හැක්කේ ........................

(1) පණ්ඩුකාභය, දුටුගැමුණු, මහදැලියමානා සහ භාතිකාභය යන රජවරුන් ය.
(2) දුටුගැමුණු, භාතිකාභය, මහදැලියමානා සහ මහා පරාක්‍රමබාහු යන රජවරුන් ය.
(3) දුටුගැමුණු, දෙවන පරාක්‍රමබාහු, මහදැලියමානා සහ භාතිකාභය යන රජවරුන් ය.
(4) පණ්ඩුකාභය, දුටුගැමුණු, මහාපරාක්‍රමබාහු සහ භාතිකාභය යන රජවරුන් ය.

38. දවුල, තම්මැට්ටම, හොරණෑව, තාලම්පට සහ රබාන යන වාද්‍ය භාණ්ඩ කාණ්ඩයට අයත් ප්‍රභේද පිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ,

(1) විතතාතත, විතත, සුසිර, ඝන සහ ආතත
(2) ආතත, විතත, විතතාතත, ඝන සහ සුසිර
(3) ආතත, විතත, විතතාතත, සුසිර සහ ඝන
(4) විතත, ආතත, විතතාතත, ඝන සහ සුසිර

39. "දොං දොං ජිං ජිං ගජිගත" යන බෙර පදයට ගායනා කළ හැකි කවි පදයකි.

(1) සත් වෙත් මහත් අදර ....
(2) අගය වඩන කවි වරුණා ....
(3) සුරිඳුන් පෙර සීටන් ....
(4) පෙරත් කලෙක සිහ රජෙක් වැටුනි වන ....

40 යහපත් මිනිසකු බිහිකිරීමෙහි ලා නර්තන කලාව මගින් මගපෙන්වන යහපත් ප්‍රතිචාරයක් **නොවන්නේ**,

(1) ආගමට දහමට හා වැඩිහිටි ගුරු දෙමව්පියන්ට ගරු කිරීම.
(2) ඉවසීම, දැරීමේ හැකියාව වර්ධනය වී පෞරුෂත්වය ගොඩනැගීම.
(3) මානසික ආතතිය වර්ධනය වී මානසික ඒකාග්‍රතාවය බිඳ වැටීම.
(4) විචාරශීලී මනසක් සහ උසස් රසවින්දන හැකියා වර්ධනය වීම.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය

# නර්තනය - II

කාලය පැය 02 යි.
අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

(i) ශාන්තිකර්ම තුනටම පොදු ආරම්භක චාරිත්‍රය ලෙස ............................................ හැඳින්විය හැකි ය.

(ii) වන්නම් නර්තනයේ දී .................................................................................... චලන යොදා ගනී.

(iii) සොකරි නාටකයේ සොත්තානා යනු ........................................................................ ගේ පුත්‍රයා ය.

(iv) ලී කෙළි නැටුමක් සහිත කැටයම් දැකිය හැක්කේ ........................................................ දේවාලයේ ය.

(v) කරදිය මුද්‍රා නාට්‍යයේ චන්දගේ චරිතය නිරූපණය කළේ ................................................ මහතා ය.

(vi) කථක් නර්ථනයේ ප්‍රධාන සංගීත සම්ප්‍රදාය ................................................................ සංගීතය වේ.

(vii) දොංතකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට යන අලංකාරය බෙර පදය අයත් තිත ............................. දෙතිත වේ.

(viii) පුරාණයේ ''පටහ බෙරය'' නමින් හැඳින්වූ අවනද්ධ භාණ්ඩය අද්‍යතනයේ ................................ නමින් ව්‍යවහාර වේ. $(1 \times 8 = 8)$

(ix) උඩරට බෙර වාදනයේ පළමු බෙර සරඹය හා දෙවන බෙර සරඹය ලියා දක්වන්න.

1. ........................................................ 2. ........................................................................

(x) නැටුම් කුල පරම්පරාවල් පිළිබඳ තොරතුරු ලබාගත හැකි සෙල් ලිපි දෙකක් නම් කරන්න.

1. ........................................................ 2. ........................................................................

$(2 \times 2 = 4)$

(මුළු ලකුණු 12)

(02) නර්තන, ගායන, වාදන වල අන්තර්ගත **තාලය** එහි ගති ලක්‍ෂණ උද්දීපනය කරයි.

(i) මාත්‍රා $2+3$ තාල රූපයට බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.04)

(ii) අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රුවින්
ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්
උක්ත රබන් කවි පද මාත්‍රා $3+3$ තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල.04)

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව මහ තනි තිතට ප්‍රස්තාර කරන්න. (ල.04)

(ලකුණු $4 \times 3 = 12$)

(03) පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ඔංචිලි වාරම් II. අංග රචනය III. වන්නම්
IV. රණබෙර V. ගැමි නැටුම් (ලකුණු $4 \times 3 = 12$)

(04) ජන නැටුම් හා ජන නාටක, ජන ජීවිතය විදහා දක්වන ජන කලාංග වේ.

(i) වෘත්තීන් හා බැඳි ගැමි නැටුමකට අයත් කවියක් ලියන්න. (ල.04)

(ii) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න. (ල.04)

(iii) සොකරි චරිතය ඇසුරින් ජන ජීවිතය විවරණය වන ආකාරය විමසුමට ලක් කරන්න. (ල.04)

(ලකුණු $4 \times 3 = 12$)

(05) පහත රූප රාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



(i) (අ) A හා B රූප මගින් කියවෙන මුද්‍රා නාට්‍ය දෙක නම් කරන්න. (ල.02)
(ආ) ඉන් එක් මුද්‍රා නාට්‍යයක චරිත දෙකක් නම් කරන්න. (ල.02)

(ii) A රූපයට හෝ B රූපයට අදාළ මුද්‍රා නාට්‍යයෙහි තේමාව විකාශනය කිරීම සඳහා නර්තනය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

(iii) ඔබ තෝරාගත් මුද්‍රා නාට්‍යය මගින් සමාජයට ලබාදෙන යහපත් ආදර්ශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල.04)

(ලකුණු $4 \times 3 = 12$)

(06) "නර්තන කලාව පිළිබඳ අතීත තොරතුරු දැන ගැනීම සඳහා ඓතිහාසික මූලාශ්‍ර වඩාත් වැදගත් වේ."

(i) නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 4ක් නම් කරන්න. (ල.04)

(ii) අනුරාධපුර යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට සාධකයක් ලියා කරුණු දක්වන්න.
(සාධකයක් ලියා දැක්වීමට ලකුණු 02)
(කරුණු දැක්වීමට ලකුණු 02)

(iii) නර්තන කලාවට භාරතීය ආභාසය ලැබුණු බවට දේශාටන වාර්තාවක් ඇසුරෙන් කරුණු දක්වන්න.
(වාර්තාව නම් කිරීමට ලකුණු 01)
(කරුණු දැක්වීමට ලකුණු 03)

(ලකුණු $4 \times 3 = 12$)

(07) "රසවින්දන ශක්තිය වර්ධනය කිරීමෙහිලා ගායනයෙන් හා නර්තනයෙන් ලැබෙනුයේ මනා පිටුවහලකි."

(i) මානසික ස්වස්තතාව කෙරෙහි බලපාන සාධක 02 නම්කර, ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

(ii) මානසික ස්වස්ථතාවය පවත්වා ගැනීමට නර්තනය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

(iii) ඔබ නරඹන ලද ගීත අනුව සිදුකරන ප්‍රාසාංගික නර්තන අංගයක් නම්කර, එම කලාංගය පිළිබඳව පහත සඳහන් ශීර්ෂ යටතේ ඔබේ අදහස් දක්වන්න.

(1) එහි අන්තර්ගත සංගීතය (ල.02)

(2) ඒ සඳහා යොදාගෙන ඇති චලන. (ල.02)

(ලකුණු $4 \times 3 = 12$)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** **නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය**

| අනු අංකය | ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර | ලකුණු |
|---|---|---|
| (01) | ක්‍රියාකාරකම - ගායනය හා වාදනය | |
| | (i) කැමති ගායනය | 5 |
| | (ii) නම්කරන ලද ගායනය(කුසපත් ඇදීම මගින්) (සොකරි, රබන්, චාමර, ඕංචිලි වාරම්) | 5 |
| | (iii) කැමති බෙර සරඹයක් තාල තබා කීම හා වාදනය | 5 |
| | (iv) කැමති බෙර පදයක් තාල තබා කීම හා වාදනය | 5 |
| | මුළු ලකුණු | 20 |
| (02) | ක්‍රියාකාරකම - සරඹ හා ගැමි නැටුම් | |
| | (i) 6 සිට 12 දක්වා ගොඩ සරඹ වලින් එකක් මධ්‍ය ලයට කස්තිරම සමග නැටීම | 10 |
| | (ii) ගැමි නැටුම් (අලංකාර මාත්‍රා දෙකක් සමග) | 10 |
| | රබන් / චාමර (කුසපත් ඇදීම මගින්) මුළු ලකුණු | 20 |
| (03) | ක්‍රියාකාරකම - වන්නම් නර්තනය සම්පූර්ණයෙන් | |
| | සිංහරාජ/ සැවුලා | |
| | (i) පද දෙකක් නර්තනය | 06 |
| | (ii) ගායනය | 02 |
| | (iii) කස්තිරම, සීරුමාරුව, අඩව්ව නැටීම | 12 |
| | මුළු ලකුණු | 20 |
| (04) | ක්‍රියාකාරකම වෘත්තීය හා බැඳි නර්තනය | |
| | කර්මාන්ත ආශ්‍රිත නර්තන නිර්මාණය | |
| | ධීවර / පතල් / කොහු / තේ / මැටි / | |
| | (නිර්ණායක පාදකව ලකුණු ලබා දෙන්න.) මුළු ලකුණු | 20 |
| (05) | නිර්මාණ හා කුසලතා | |
| | නාට්‍ය ගීතය අනුව නර්තනය නිර්මාණය | 10 |
| | මෙම ගිම්හාන / හනික වරෙව් කොල්ලනේ / දී කිරි දී කිරි | 10 |
| | නර්තන නිර්මාණය - රජ කුමරිය / හංසයා / මහළු කාන්තාව / ධීවරයා / ගොවියා / සිංහයා | |
| | මුළු ලකුණු | 20 |

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 1 ) | 04. ( 4 ) | 05. ( 4 ) | 06. ( 2 ) | 07. ( 3 ) | 08. ( 3 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. (1 ) | 12. ( 4 ) | 13. ( 1 ) | 14. ( 4 ) | 15. ( 2 ) | 16. ( 4 ) | 17. ( 3 ) | 18. ( 1 ) | 19. ( 3 ) | 20. ( 2 ) |
| 21. (4 ) | 22. ( 1 ) | 23. ( 4 ) | 24. ( 2 ) | 25. ( 4 ) | 26. ( 2 ) | 27. ( 1 ) | 28. ( 3 ) | 29. ( 1 ) | 30. ( 2 ) |
| 31. (4 ) | 32. ( 4 ) | 33. ( 2 ) | 34. ( 1 ) | 35. ( 1 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 1 ) | 39. ( 3 ) | 40. ( 3 ) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

## II කොටස

(01) (i) කප් සිටුවීම (ල. 01) (ii) තාලානුකූල (ල. 01) (iii) වෙදරාළ (ල. 01)
(iv) ඇම්බැක්කෙ (ල. 01) (v) සේන වලවේ (ල. 01) (vi) හින්දුස්ථානි/ රාගධාරී (ල. 01)
(vii) සුළු මැදුම් (ල. 01) (viii) දවුල
(ix) අ. තකට ... ආ. තකට කුඳට (ල. 02)
(x) අ. සැස්සේරුව ආ. කොරවක්ගල (ල. 02)

1 - 8 = ල. 08 යි
9 - 10 - ල. 2 × 2 = 4
ල. 12

(02) (i)

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |

නිවැරදිව තාල සංඥා සහ ආවර්ත සදහා -ල.2 බෙර පදය නිවැරදිව ප්‍රස්ථාර කිරීමට ල. 02(ලකුණු 04 යි.)

(ii)

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | අත | ක | ට | ගෙ | න | ර | බන් | - | පො | ඩි | ය |
| + | වය | ති | දි | සි | රු | වින් | - | - | - | - | - |
| + | ගත | පි | ට | බ | ද | සො | ල | වා | - | සි | ලි |
| + | සිලි | න | ද | ක | ර | මින් | - | - | - | - | - |

මාත්‍රා විභාග කිරීම හා සංකේත යෙදීමට - (ල. 02) කවි පදයක් නිවැරදිව ප්‍රස්තාර කිරීමට - (ල. 02) (ලකුණු 04)

(iii)

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ත | කඩ | තක | තරි | කිට |
| කි | ත | ක | දො | මි | ති | ග | ත | කිත් | - | තත් | - | කු | ද | කු | ද |
| තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ත | තරි | කිට | කුං | දත් |
| තා | | | | | | | | | | | | | | | |

මාත්‍රා විභාග කිරීම හා සංකේත යෙදීමට - (ල. 02) අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කිරීමට - (ල. 02) = (ල. 04)
(මුළු ලකුණු 12)

(03) (i) <u>ඔංචිලි වාරම්</u>

- අවුරුදු කාලවලදී ජන ක්‍රීඩාවක් ලෙස ඔංචිලි වාරමම් යොදා ගනී.
- ත්‍රිවිධ රත්නය සහ පත්තිනි දෙවියන් ප්‍රධාන කොට ගායනා සැකසී ඇත.
- ආඝාතාත්මක සහ අවාඝාතාත්මක ව ගායනා කරයි.
- විවිධ නාද මාලා ඇත.
- බුදු ගුණ තුණ්සරනේ කවි සහ දෙවි දේවතාවුන්ට පිංදීමේ කවි ද දක්නට ඇත.
- විනෝදාස්වාදය සඳහා මෙම කවි ගායනා කරයි.
- ඔංචිලි වාරම් කවිය ලියා ඇත්නම් (ල. 04)

(ii) <u>අංග රචනය</u>

- අංග යනු මුහුණ ප්‍රධාන කොට ඇති ශරීරයේ අඟ පසඟ වේ. චරිතයේ ස්වභාවයට හා රංගාලෝකයට ගැලපෙන පරිදි ශරීර අඟ පසඟ වර්ණ සහ හැඩගැන්වීම මේ ආදී වශයෙන්....
- අංග රචනය පිළිබඳ හඳුන්වා දීම.
- රංග කාර්යයේදී නර්තනය හෝ නව නිර්මාණ සඳහා අංග රචනය ප්‍රයෝජනවත් වේ.
- ප්‍රධාන වශයෙන් මෙය කොටස් දෙකකි.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

- භාවිතයට ගන්නා ද්‍රව්‍ය පිළිබඳ හඳුනාගෙන විස්තර කර තිබීම.
- වර්ණ සංකලන සාම්ප්‍රදායික හා නව නිර්මාණයන්ට අනුව රචනා කර ගනී.
- අංග රචනය කිරීමේ විධික්‍රම, සරල අංග රචනය, විකාර රූපී අංග රචනා ක්‍රම පිළිබඳ හඳුන්වා තිබීම.

(ල. 04)

<u>වන්නම්</u>

- දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් පොදු අංගයක් බව.
- උඩරට, සබරගමු සම්ප්‍රදායන්හි වන්නම් යනුවෙන් ද පහතරට සිංදු වන්නම් යනුවෙන් ද හඳුන්වන බව
- සම්ප්‍රදායන් තුනෙහිම වන්නම්වල සංඛ්‍යාත්මක වෙනසක් ඇති බව.
- වන්නම් ප්‍රථමයෙන් ගායනය සඳහා රචනා වී ඇති බව.
- රචනා කිරීමට බලපෑ හේතු, රචනා කිරීමට දායක වූවන්, රචනා වූ කාලය පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වා තිබීම.
- ශාන්තිකර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
- අන්තර්ගතය දක්වා තිබේනම් (ව්‍යුහය) (ල. 04)

<u>රණබෙර</u>

- අතීතයේ සන්නිවේදන කාර්යය සඳහා යොදා ගත් අවස්ථාවකි.
- යුද්ධ ජයග්‍රහණ, සෙබලු දිරිමත් කිරීම හා යුධ අවස්ථාවලට පිටත් වීම යන අවස්ථා සන්නිවේදනය කිරීමට මේවා භාවිතා කරයි.
- විශේෂිත වූ බෙර පද කොටසක් මේ සඳහා වාදනය කරයි.
- දවුල භාවිතා කරයි.
- වීර රසය ජනනය වන බව.

<u>ගැමි නැටුම්</u>

- ගැමියන් විසින් නිර්මාණය කරගත් බව
- සරල නර්තන අංගයක් බව
- රංග උපකරණ භාවිතා වන බව
- සරල ඇඳුම් පැළඳුම් වාදන භාණ්ඩ විවිධතා ඇතිව භාවිතා වන බව.
- ගායනයට මූලිකත්වය ලැබෙන බව.
- සාමූහිකව රංගනයේ යෙදෙන බව. (මාතෘකා තුනක් විස්තර කිරීමට $3 \times 4 = 12$)

(04) (i) වෘත්තීන් හා බැඳි ගැමි නැටුමක කවියක් ලියා ඇත්නම් (කවි පද 04ට ලකුණු 04)

(ii)
1. පූජාර්ථය සඳහා (සෙතක් ශාන්තියක් ලබා ගැනීම) (පත්තිනි ඇදහීම)
2. සශ්‍රීකත්වය වර්ධනය කරීම හා සමෘද්ධිය පැතීම.
3. විනෝදාස්වාදය සඳහා
4. වසංගත රෝග ස්වභාවික විපත් ආදියෙන් ආරක්ෂා වීම. (කරුණු දෙකක් ලියා ඇත්නම් ල. 04)

(iii)
- සොකරි රූමත් ගැමි කාන්තාවක් බව
- රූමත් බව නිසා පිරිමි ආකර්ශනය ලැබෙන බව
- ස්වාමිපුරුෂයා සමග යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට අපේක්ෂාකරන බව
- කාන්තාවන්ගේ අසරණතාව බලවත් පුද්ගලයින්ගේ ග්‍රහනයට ගොදුරු කරන බව.
- කවි යොදාගෙන තිබීම. (කරුණු දෙකක් මගින් විස්ර කර ඇත්නම් ල. 04) (මුළු ලකුණු 12)

(05) (I) (i) A කරදිය මුද්‍රා නාට්‍යය
B කුඹී කතාව මුද්‍රා නාට්‍යය (නම් කිරීමට ල. 02)

(ii) A සිසී, චන්ද්, මණ්නඩි රාල B කුහුඹුවෝ, මදුරුවා, කුරුමිණියා (චරිත දෙකකට ල. 02)

(II) A කරදිය

- තේමාව විකාශනය සඳහා ඒකල යුගල සමූහ නර්තන භාවිතය
- දේශිය නර්තන සම්ප්‍රදායන් භාවිතය (උඩරට, පහතරට)
- බටහිර බැලේ ආභාෂය හා භාරතීය ආභාෂය උදා:- (මකුළුවා, කථකලි නර්ථනය)
- කිසිම නර්තනයකට කොටු නොවූ ප්‍රකාශනාත්මක චලන භාවිතය (නිදහස් චලන) (ධීවරයෝ දැල් අදින අවස්ථාව)

B කුඹී කතාව

- තේ පෝච්චිය හා කෝප්ප වේදිකාවට ප්‍රවේශ වන්නේ නර්තනයෙනි. (සංකේතාත්මක නර්තනය කලාත්මකව ඉදිරිපත් කර ඇත.)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

- කුරුමිනියාගේ තම්මැට්ටම් වාදනය ඉතා කලාත්මකව ඉදිරිපත් කර ඇත.
- සතුන්ගේ විවිධ හැසිරීම් පාදක කරගත් චලන ඇතුළත් කලාත්මක රංග රචනයක් දැකිය හැකි වීම. (කුඹින් අත්දෙක එකතු කරන චලන) (උදා:- කුහුඹුවන්ගේ ගමන් තාල ළමා මනසට යෝග්‍ය ලෙස යොදාගෙන තිබීම) (කරුණු දෙකක් විස්තර කිරීමට ල. 04)

(III) A කරදිය
- මැස්සන් මකුළුවා පරාජය කිරීම සටන් කිරීමෙන් අයිතිවාසිකම් ජයගත හැකි බව.
- ධීවර ජනතාවට අත් වූ අසාධාරණය දුරුකළ යුතු බව.
- සමාජ පංති භේද තුරන් කළ යුතු බව.

B කුඹී කථාව
- කුහුඹුවන්, පළඟැටියන්, මදුරුවන් වැනි විවිධ සත්ත්ව වර්ගමගින් විවිධ ජාතීන් අතර සමගිය තහවුරු කිරීම.
- කැඩුනු නිවස නැවත තැනීම - අභියෝගවලට මුහුණදීමේ හැකියාව. වැටුනත් නැගිටීම.
- මදුරුවාට උදව් කිරීම - විපතේදී සතුරාට පවා පිහිට වීම.
- තේ පෝච්චිය හා කෝප්ප හැසිරවීම - ආගන්තුක සත්කාරය. (කරුණු 2ක් විස්තර කිරීමට ල.04) (මුළු ලකුණු $4 \times 3 = 12$)

(06) (i)
- වංශකතා
- සෙල්ලිපි
- සාහිත්‍යමය කෘති
- පුරාවිද්‍යාත්මක සාධක
- කැටයම්
- රූකම්
- දේශාටන වාර්තා (මූලාශ්‍ර 4 ක් නම් කිරීමට ල. 04)

(ii) රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට අනුරාධපුර යුගයට අයත් ඕනෑම සාධකයක් ලියා ඇත්නම් (සාධකය ලියා දැක්වීමට ල. 02) (කරුණු 02ක් ඉදිරිපත් කිරීමට ල. 02)

(iii) ඉබන් බතුතාගේ දේශාටන වාර්තාව (වාර්තාව නම් කිරීමට ල. 02) (ග්‍රන්ථය - විදේශීන් දුටු පුරාණ ලංකාව)
- විදේශිකයින් ලාංකේය නර්තනය අගය කළ අතර එය නරඹා සතුටු වූ බව
- හින්දු බාලිකාවන් යනු දේවදාසීන් බව
- දේවදාසීන් දෙවියන් සතුටු කිරීමට නර්තනය යොදාගෙන ඇති බවත් එම නර්තනය භාරතීය නර්තනය විය හැකි බව.
- ආගමික කටයුතු පූරණය කිරීමට නර්තනය යොදාගෙන ඇති බව.
- ගම්පොළ යුගයේ නර්තන කලාව තුළ භාරතීය ආභාෂය පිළිබිඹු වන බව. (කරුණු 02 ක් ලියා දැක්වීමට ල. 02)

(07) (i) කායික සාධක මානසික සාධක දක්වා ඉන් එකක් විස්තර කිරීමට (ල. 04)

(ii)
- ස්වස්ථතාව යනු ශාරීරික තත්වයන් ඉක්මවා ඉන් ඔබ්බට ගිය මානසික, සමාජීය හා අධ්‍යාත්මික ත්ත්වයක් බව.
- නර්තය ක්‍රියාකාරකම් මගින් සිසුන්ගේ චිත්තවේග ශක්තීන් ශාරීරිකව මුදාහැරීම හා එහි ක්‍රියාකාරකම් මගින් මානසික තත්ත්වයන් පවත්වා ගැනීමට උපකාරී වන බව
- සංචලන ක්‍රියාවලියේ දී මනෝචාලක ක්‍රියාකාරකම් වර්ධනය වන බව
- නර්තන ක්‍රියාකාරකම් නිවැරදිව පවත්වාගැනීම තුළ මානසික ඒකාග්‍රතාව පවත්වාගත හැකි බව.
- නර්තනය හා බැඳි රූපන ක්‍රියාකාරකම් මගින් මානසික ආවේදන, භාව හැඟීම් ප්‍රකාශනයට ඉඩ ලැබෙන බව සහ ඉන් රසවින්දනය ජනිත කරන බව හා එයින් සිත සැහැල්ලු වීම හා සහනශීලි බව ඇතිවීමට බලපාන බව.
- ජය පරාජය සම සිතින් පිළිගැනීම, ඉවසීම හා සංයමය ඇතිවීම.
- දරාගැනීම හා කැපවීම, බෙදාහදා ගැනීම, එකමුතු බව වර්ධනය වන බව
- තර්කානුකූල චින්තයන හා නිර්මාණශීලී චින්තනය වර්ධනය වන බව.
- ඇගයීම හා පැසසීම තුළ චිත්තවේග දිරි ගැන්වෙන බව (ආදී වශයෙන් කරුණු 2ක් පැහැදිලි කිරීමට ල. 04)

(iii) 1.
- තාලානුකූල, රිද්මයානුකූල හා ප්‍රකාශන චලනවලට උචිත ලෙස තනු නිර්මාණය හා සංගීත රිද්ම රටා භාවිත කර ඇති බව.
- සංගීතය මගින් ගීතයේ භාවමය හැඟීම් උද්දීපනය කරන බව
- නර්තනය විචිත්‍රත්වයට සංගීතයෙන් විශාල මෙහෙයක් වන බව

2.
- ගීතයට යොදාගෙන ඇති චලනවල උචිත අනුචිත බව.
- තාලය, රිද්මය හා ප්‍රකාශනය ඉස්මතු වන සේ චලන යොදාගෙන ඇති බව.
- තාලය, රිද්මය හා ප්‍රකාශනයට සුසංගත වුන එය තිව්‍ර වන සේ භාව චලන උද්දීපණය වන සේ රස ජනනය කිරීමේ චලනය නිර්මාණය කර ඇති බව. $(2 \times 2 = 4)$ (මුළු ලකුණු $3 \times 4 = 12$)